# ගාල්ල, පරගොඩ රජමහා විහාරයේ ඉපැරැණි බිතු සිතුවම්.

මදුශිකා එම්.ජී.එච්

## හැඳින්වීම

ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් වටිනා පරගොඩ රජමහා විහාරය සෞන්දර්යාත්මක පසුබිමකින් චිත්‍රනය වූ ස්ථානයකි. ගාල්ල - අකුරැස්ස ප්‍රධාන මාර්ගයෙහි කිලෝමීටර් විස්සක් පමණ ගිය විට ප්‍රධාන මාර්ගයේම වම්පසට වන්නට පරගොඩ රාජමහා විහාරය පිහිටා ඇත. පුරාවිද්‍යාත්මක වශයෙන් වටිනා සිතුවම්, ප්‍රතිමා හා ඉදිකිරීම් මෙම පුදබිම ඇසුරින් හඳුනාගත හැකිය. මෙහි ඉතිහාසය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසෙහි මහින්දාගමනයෙන් පසුව දේවානම්පියතිස්ස රජ දවස ශ්‍රී මහා බෝධියෙන් හටගත් දෙතිස් මහා ඵලරුහ බෝධීන් වහන්සේලා දිවයින පුරා රෝපණය කිරීමේ දී ඉන් එක් බෝධි අංකුරයක් මෙම ප්‍රදේශයේ රෝපණය කර ඇත. ජනප්‍රවාදගත තොරතුරු අනුව ශ්‍රී මහා බෝධියේ අංකුර රට පුරා රැගෙන යන අතරතුර පරගොඩ ප්‍රදේශයට ද පැමිණ තිබේ. එහිදී ගමන් විඩාව සංසිඳුවා ගැනීම පිණිස මෙම ස්ථානයේ බෝධි අංකුරය තබා ගොස් පසුදා පැමිණි පිරිසට දැක ගැනීමට හැකි වූයේ එම ස්ථානයේ වූ බෝධි අංකුරයෙන් මුල් දමා ඇති ආකාරයයි. එම නිසා එම ස්ථානයේ බෝධිය රෝපණය කළ බව පැවසේ. ඊට අමතරව මෙම ප්‍රදේශයට නම ලැබීමට මුල් වූ කථා පුවතකුත් මෙහිදී හමුවේ. දුටුගැමුණු රජුගේ සහායට පැමිණි ඉන්දියානු භට සේනාවක් මෙම ගමෙහි ජීවත් වූ නිසා පරදේශක්කාරයින් ජීවත් වූ ප්‍රදේශය පරගොඩ නමින් ව්‍යවහාර වූ බවයි. මෙම විහාරය පිළිබඳව ඇති ඓතිහාසික මූලාශ්‍රය අනුව අනුරාධපුර යුගයේ රචිත පාලි බෝධිවංශයෙහිත්, දඹදෙණි යුගයේ එහි පරිවර්තනයක් වූ සිංහල බෝධිවංසයෙහිත් බෝධි රෝපණ කථා නැමැති පරිච්ඡේදයෙහිත් සඳහන් වේ. (Budusarana newspaper 2010). මෙම විහාරයේ ආරම්භය අනුරාධපුර යුගය දක්වා දිවයයි. ක්‍රමක්‍රමයෙන් විවිධ කාලවකවානුවලදී මෙම විහාරස්ථානය සංවර්ධනය වෙමින් පැමිණ ඇත. එහි ඇති ශෛලමය සඳකඩපහනක්, චෛත්‍යසරයක් තිබූ බවට සාධක සහිත කුඩා ස්තූපය වටා ඇති ශෛලමය ස්ථම්භයන්, බෝධිය හා සම්බන්ධකර ඇති ගල් පිහිල්ල, විහාර මන්දිරයෙහි බිත්තිවල හා සිවිලිමේ ඇති ඉපැරණි සිතුවම් ආදී පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකම් රැසකගේ අගයන් මෙහිදී හඳුනාගත හැකිය.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණය සඳහා ක්ෂේත්‍ර නොවන හා ක්ෂේත්‍රගත අධ්‍යයන ක්‍රමවේදයන් අනුගමනය කර ඇත. ක්ෂේත්‍ර නොවන ගවේෂණයේ දී ඊට අදාල අන්තර්ජාලය පරිශීලනය කර තිබේ. ක්ෂේත්‍ර ගවේෂණය මගින් අදාල ක්ෂේත්‍රය වෙත ගොස් ඒ පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ දී සම්මුඛ සාකච්ඡා ආදි ක්‍රමවේද භාවිත කරන ලදි.

## විමර්ශනය

පරගොඩ රජමහා විහාරයෙහි අලංකාර සිතුවම් හා ප්‍රතිමාවන්ගෙන් සමන්විත විහාර මන්දිරය දෙවනපෑතිස් රජුගේ සෙනවියෙකු විසින් ප්‍රථමයෙන් ඉදිකර ඇත්තේ විශාල ගල්කුළක දැවයෙනි. පසුව දැවයෙන් කළ ඉදිකිරීම විනාශ වීමෙන් පසුව ක්‍රි.ව. 876 දී නැවත ශක්තිමත්ව ගඩොලින් නිමකර ඇත. එහිදී ප්‍රතිසංස්කරණයන්ට ලක් වී තිබුණ ද ප්‍රතිමා ගෘහය තුළ ඇති ප්‍රතිමා මහනුවර යුගයේ මුල් නිර්මාණ ලෙස හඳුනාගත හැකිය. අටවිසි බුදුරජාණන් වහන්සේලා නිරූපණය කිරීම සඳහා මෙම ප්‍රතිමා ගෘහය නිර්මාණය කර ඇති අතර හිටි පිළිම හා හිඳි පිළිම රැසකින් මෙම විහාර මන්දිරය සමන්විත ය. (ඡායාරූප අංකය 01). මත්ස්‍යාකාර නේත්‍රා හා දිය රැලි ආකාරයේ චීවරය ද සිරස්පත ආදි

එක්කර තිබීමත්, අශ්ව ලාඩමාකාර හැඩයෙන් යුතු රුස් වළල්ල ආදි ලක්ෂණයන් මඟින් නුවර යුගයේ කලා ලක්ෂණ ප්‍රකට කරවයි. (ඡායාරූප අංකය 02). මෙම විහාර මන්දිරය ඇතුළත මාලය හා පිටත මාලය අලංකාර සිතුවම්වලින් සරසා තිබේ. මහනුවර යුගයට අයත් පහතරට සිතුවම් සම්ප්‍රදායට අයත් සිතුවම් දැකගත හැකි විහාරස්ථානයකි. එම සිතුවම් හී හඳුනාගනු ලබන විශේෂ ලක්ෂණ හා කලා සම්ප්‍රදායන්, නිර්මාණ ශෛලීන් හී දක්නට ලැබෙන ලක්ෂණ ආදිය පිළිබඳව කලාත්මක, ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් මෙහිදී සිදු කෙරේ.

ඓතිහාසික වශයෙන් මෙරට ශේෂ වී ඇති වැඩිම සිතුවම් ප්‍රමාණයකට උරුමකම් කියන්නේ මහනුවර සම්ප්‍රදායේ සිතුවම් ය. එම සිතුවම් සම්ප්‍රදාය මහනුවර යුගයේ දී කන්ද උඩරට මූලික කරගෙන ඇරඹුණු අතර ඉන්පසුව පහතරට ප්‍රදේශවලට ද ව්‍යාප්ත වූ බව පහතරට ප්‍රදේශ ආශ්‍රිතව ඉපැරණි විහාරවල ඇඳ ඇති සිතුවම් ශෛලීන් මඟින් පෙනේ. එම අවධියේ දී උඩරට හෝ පහතරට විහාර දේවාලවල බිතුසිතුවම් කලාවේ කාර්යයෙහි නියුතු වූයේ බිතුසිතුවම් කලාව ප්‍රගුණකල ශිල්පීන් පමණක් ද යන්න විමසීමේ දී පෙනී යන්නේ විහාර බිතුසිතුවම් කලාව ප්‍රගුණකල ශිල්පීන්ට අමතරව පරිබාහිර වෙනත් කලා ක්ෂේත්‍රවල ශිල්පීන්ගේ ද සහාය ලැබී ඇති බවයි. විශේෂයෙන් පහතරට විහාර සිතුවම් අධ්‍යයනයේ දී පැහැදිලිවන්නේ බලි ඇඳුරන්ගේ නිර්මාණාත්මක සහයෝගය ද ඒ සඳහා ලැබී ඇති බවයි. දකුණු පලාතේ විහාර සිත්තරුන් ද සෙවන යෙදීමේ උපාය මඟින් ත්‍රිමාණ ත්‍රිමාණාකාරව රූපවල යම් අඟ පසඟ පෙන්වීමට බලි ඇඹීම් කලාවෙන් ආභාසය ලබාගන්නට ඇතැයි අනුමාන කරයි. (ලක්දුසිංහ 1990, පිටු 120). එවැනි කලාවක් මාතර කොටිකාගොඩ පුරාණ විහාරය, දෙණිපිටියේ වැලිහිඳ සුදර්ශනාරාමය, අහංගම එළුකැටියේ විහාරය මෙන්ම ඓතිහාසික පරගොඩ රජමහා විහාරයෙහි ද සිවිලිම් චිත්‍ර අතර මෙම ලක්ෂණ දැකගත හැකිය.

විහාර සිත්තරුන් බලි චිත්‍ර කලාවේ ද නිරතවූයේ ද යන්න නිශ්චිතව හඳුනාගත නොහැකි වුවද එම කලාවන් දෙකම එකට ගමන්කළ බව විහාර සිතුවම් හා බලි සිතුවම් එකට අධ්‍යයනයෙන් පෙනී යයි. ඒ බවට පරගොඩ රජමහා විහාරයේ ද සිවිලිමේ ඇඳ ඇති දේව රූප හා දේව රථ සිතුවම ද රාශි දොළහ දැක්වෙන සිතුවම ද මානව ශරීරයට සත්ව හිස් එක්කර අඳින ලද සිතුවම හා නව ග්‍රහයින් සංකේතවත් කරන සිතුවම් ආදී මඟින් වියන් සිතුවම් කලාවට බලි සිතුවම් කලාව ද එක්කර ගෙන ඇති බවක් පෙනේ. මෙහි එන රාශි දොළහ දැක්වෙන සිතුවම විශේෂ ය (ඡායාරූප අංකය 03). එනම් වෘත්තාකාර චක්‍රයක් තුළ කොටස් දොළොසකට බෙදා ඒ තුළ රාශි දොළොස ඇඳ තිබේ. පෙති විසිහතරකින් යුත් පද්මයක් වටා එකා පසු පස එකා ගෙල පටලා ගනිමින් එකම දිශාවකට ගමන් ගන්නා හංස පෙළකි. ඉන් පිටතින් ඇති චක්‍රය තුළ මෙම රාශි දොළස ඇඳ තිබේ.

ඒ අනුව මෙසේ රාශි දොළස නිරූපණය කරන කැටයම් ද හමු වී ඇත. උදා; දැනට කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත්කර තිබෙන ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසට අයත් බව සැලකෙන අභයගිරියෙන් සොයාගත් විශාල ගල් තහඩුවෙහි ද ආයත චතුරස්‍රාකාර තලය වටා **"රාශි දොළොස"** කැටයමට නඟා තිබේ. එසේම නැකැත් සහ රාශි පිළිබඳ නක්ෂත්‍ර රූපවල අංග ලක්ෂණ සඳහන් කවි රාශියක් යාග සාහිත්‍යයේ ද අන්තර්ගත වේ.

වියන්තල සැරසිලි අතර වැඩි වශයෙන් සාම්ප්‍රධායික සැරසිලි මෝස්තර යොදාගෙන තිබේ. සාම්ප්‍රධායික සැරසිලි මෝස්තර නිර්මාණය දිව්‍ය, සත්ව, උද්භිද, නිර්ජීවී යන ආකාර සතරකි. මහනුවර යුගයේ සිතුවම්වල මෙකී සම්ප්‍රධායික සිංහල සැරසිලි මෝස්තර ඉඩ වැසීම සඳහා ප්‍රධාන වශයෙන් යොදාගෙන තිබේ. මෙහි

දිව්‍ය ගණයට ගැනෙන ඉර හඳ සංකේතවත් කර ඇත්තේ සදාකාලික බව නිරූපණයවන අයුරිනි (ඡායාරූප අංකය 04). සත්ව ගණයට අයත් සිතුවම් අතර මෙහි එන හංස පූට්ටුව, භේරුණ්ඩ පක්ෂියා, මකරා, යන මෝස්තර ද දැකගත හැකිය.

උද්භිද ගණයට අයත් සිතුවම් අතර බහුල වශයෙන් වියන්තලය සැරසීමට නෙළුම් මල් මෝස්තරය යොදාගෙන තිබේ. ඊට අමතරව නාරිලතා මල, පිච්ච මලෙහි විකාශනයක් හා මල්, ගෙඩි හා පොහොට්ටුවලින් යුත් ලියවැල් මෝස්තරයන් මඟින් ද වියන්තලය අලංකාරවත් කර ඇත (ඡායාරූප අංකය 05). නිර්ජීවී ගණයට අයත් මෝස්තර ලෙස අරිම්බුව හා ගල් බිංදුව යොදාගෙන තිබේ. මෙම සිතුවම් හී වර්ණ භාවිතයේ දී වියන්තල සිතුවම් අතර රතු හා කළු වර්ණය යොදා ගෙන තිබේ. බිත්ති මත පසුතලය වැසීමට රතු වර්ණයට මූලිකත්වය දී ඇති ආකාරය පෙනේ. චිත්‍ර සඳහා ද රතු, කහ, දුඹුරු පැහැ වර්ණයන් ප්‍රධාන වශයෙන් යොදා ගැනීම සිදු වී ඇත. බාහිර රේඛා භාවිතය හා පැතලි වර්ණ රටාවක් යොදාගැනීම මෙම චිත්‍ර හී ඇති ලක්ෂණයන් අතර වේ. හිස් ඉඩ වැසීම සඳහා සිතුවම් මෝසතර යලි යලිත් යොදාගනු ලැබීම දැකිය හැකිය. මෙහි එන සිතුවම් අතර විශ්ණු දේවාලයට පිවිසෙන දොරටුවට ඉහළින් මෙරට රාජ්‍යත්වය පෙන්වන ඔටුන්නක් හා අශ්‍යවයින් දෙදෙනෙතු හා ඒ මධ්‍යයේ බ්‍රිතාන්‍ය යටත්විජිත කොඩියේ කොටසක් නිරූපණයවන සේ සංකේත ලාංඡනයන් භාවිතාකර තිබේ (ඡායාරූපය අංකය 06). මෙවැනිම ලාංඡනයක් කතළුව පූර්වාරාමයේ ද නිර්මාණිත වර්ෂය දැක්වීමේ දී යොදාගෙන ඇත.

මෙම විහාරස්ථානයෙහි දක්නට ඇති සිතුවම් යුග කිහිපයකට අයත් ය. ඉන් කොළඹ යුගයට අයත් චිත්‍ර ශිල්පියෙකු වූ එම්. සාර්ලිස් චිත්‍ර ශිල්පියාගේ චිත්‍ර ආකාර කිහිපයක් ම දක්නට ලැබේ. විහාර මන්දිරය ඇතුලත මාලය හා පිටත මාලය ලෙස මාලක දෙකකි. නුවර යුගයට අයත් සඳකඩපහණකින් විහාරයට ඇතුළු වේ. ඇතුළු මාලයට පිවිසීමේ දී කිහිඹි මුහුණින් විහිදී ගිය තොරණක් සිතුවම්කර තිබේ. ඊට දෙපසින් දොරටුපාල රූ දෙකකි. මාලයේ දොරටුව අභියස ඇතුළු මාලයෙහි පිහිටි හිටි බුද්ධ ප්‍රතිමාව ද නුවර යුගයට අයත් කලා ලක්ෂණවලින් යුක්ත ය. සැරියුත් මුගලන් දෙනම දෙපසින් වැඳ සිටී. රහතන් වහන්සේලා පරසතු මල් රැගෙන අහසෙහි සිට පෙළට වන්දනා කරන ආකාරයකින් සිතුවම්කර තිබේ. පිටත මාලයෙහි එක් පසෙකින් සත් සතිය නිරූපණය කරන ආකාරයට බුදු රූ අඹවා ඇති අතර පසුතලයෙහි එනම් බිත්තියෙහි අලංකාරවත්ව අදාල සිද්ධියට ගැලපෙන පරිදී සිතුවම් ඇඳ තිබේ. පළමු සතිය ඇසතු බෝ මුල වැඩ සිටීමත්, දෙවන සතිය අනිමිසලෝචන පූජාව සිදුකිරීමත්, තෙවන සතිය රුවන් සක්මනෙහි යෙදීමත්, සිව්වන සතිය රුවන්ගෙයි වැඩ සිටීමත්, පස්වන සතිය අජපාල නුගරුක මුල වැඩ සිටීමත්, සයවන සතිය මුචලින්ද නා දරණ යට වැඩ සිටීමත්, සත්වන සතියෙහි කිරිපලු නුගරුක මුල වැඩ සිටිමින් සත් සතිය ගතකර ආකාරය මෙහිදී නිරූපිත ය (ඡායාරූප අංකය 07). එම පසුතලය සකස්කර ගැනීමේ දී ශිල්පියා විසින් ස්වභාවික පරිසරය මනා සේ නිරූපණය කිරීමට උත්සාහ ගෙන තිබේ. මල්, ඵල, හා වෘක්ෂ ඒ ඒ ආකාරයෙන් අනන්‍යතාවය තහවුරුවන පරිදි සිතුවම්කර තිබේ. එම වෘක්ෂයන් හී ස්වභාවය පත්‍ර මඟින් මනාව නිරූපණය වන සේ ඇඳ ඇත.

එසේම පක්ෂීන්, ලේනුන් වැනි සතුන් දක්වමින් ද පසුතලයෙහි ඉඩ වැසීමට යොදාගෙන තිබේ. වර්ණ භාවිතයේ දී රතු පැහැයට මුල් තැනක් දෙමින් පසුබිම පුරවා ඇති අතර නිල්, කහ, රතු යන මූලික වර්ණයන් භාවිතකර තිබීමෙන් මහනුවර චිත්‍ර ශිල්පීය ගති ලක්ෂණ නිරූපණය කරයි. වාස්තු විද්‍යාත්මක වශයෙන් වැදගත්වන ගොඩනැගිලි ඉදිකිරිම සම්බන්ධව එම සිතුවම තුළ ඇති රුවන්ගෙයි සිතුවම

පෙන්වාදිය හැකිය. අර්ධ වෘත්තාකාර උළුවස්සත්, උළු සෙවිලිකල වහලයත්, උස් වූ කැටයම් සහිත කුළුණු භාවිතය ඒ වන විට ප්‍රභූ නිවාස ඉදිකිරීමේ දී බහුල වශයෙන් යොදාගෙන තිබේ. මෙම බිත්තියට ඉදිරිපස බිත්තියෙහි දැක්වෙන සිතුවම් කොළඹ යුගයේ චිත්‍ර ශිල්පියෙකු වූ එම්. සාර්ලිස් ශිල්පියාගේ සිතුවම් ශෛලියට අයත් සිතුවම් ය. ඒවා සමචතුරස්‍රාකාර හැඩැති කොටු හී වෙන් වෙන් වශයෙන් සිදුවීම් නිරූපණයකර ඇත. මෙම සිතුවම් ආකාර කිහිපයක් යටතේ ඇඳ තිබේ. බුද්ධ චරිතය හා සම්බන්ධ, ජාතක කථා, ඓතිහාසික සිදුවීම් ආදී වශයෙනි.

මෙහි එන සිතුවම් ශිල්පියා විසින් ආකාර දෙකකින් ඇඳ ඇත. ආරම්භක අවස්ථාවේ දී චිත්‍ර ඇඳ අලංකාර වර්ණ භාවිතයකින් සම්පූර්ණකර ඇති බව පෙනේ, එවැනි සිතුවම් අතර කිහිපයක් ලෙස; තුන් බෑ ජටිලයන් දමනය කිරීම, කිඹුල්වත්පුරයට වැඩම කොට ශාක්‍යයන්ගේ මානය දුරු කිරීම, සුජාතාවගේ කිරිපිඬු පූජාව, බුද්ධත්වයෙන් පසු තුන් ලොවටම දහම් දෙසන ලෙස දැක්වෙන දේවාරාධනය, මුචලින්ද නාග දරනය, සොත්ථිය බමුණා විසින් පූජාකල කුසතණ අටමිට පිළිගැනීම වැනි අවස්ථාවන් දීප්තිමත් වර්ණ භාවිතයෙන් නිර්මාණයකර තිබේ. ඊට අමතරව මනා සම්පිණ්ඩනය, විචිත්‍ර සැරසිලිකරණය, එළිය අඳුර හා ත්‍රිමාණ ලක්‍ෂණ පෙන්වීම, බටහිර ස්වභාවික ශෛලියේ ආභාසය වැනි ලක්‍ෂණ සාර්ලිස්ගේ එම සිතුවම් හී අන්තර්ගත වී තිබේ. අනෙක් සිතුවම් අසම්පූර්ණ නිමාවකින් යුතු බවත් පෙනේ. ඒ අනුව සුදු වර්ණය වැඩි වශයෙන් ද රේඛාවට මුල් තැනක් දෙමින් ඇඳ ඇති එම චිත්‍ර හා තවත් මෝස්තර නිර්මාණයන් හී එවැනි ම ලක්ෂණ දැකගත හැකිය. සතර පෙර නිමිති දැකීම, නළඟනන්ගේ විප්‍රකාර දැකිම, කන්ථක අසුපිට නැඟ ගිහිගෙයින් නික්ම යාම, කේෂ ඡේදනය, වැනි අවස්ථාවන් නිරූපනණය කිරීමට ශිල්පියා උත්සාහගෙන ඇති ආකාරයක් පෙනේ. (ඡායාරූප අංකය 08).

මෙම පරගොඩ රජමහා විහාරයේ සිතුවම් නිර්මාණය පිළිබඳව අධ්‍යයනයේ දී එය යුග කිහිපයකට අයත් හා ශෛලීන් කිහිපයකින් යුතුව ඇඳි සිතුවම් බව පැහැදිලි වේ. එම සිතුවම් හී දක්නට ලැබෙන සුවිශේෂී ලක්‍ෂණයන් පිළිබඳව මෙමඟින් පැහැදිලි වේ. පසුකාලීනව ඉමදුව කෝදාගොඩ ගෝනන්නේවිල ටීමන් ගුරුන්නාන්සේ යන අය විසින් මෙහි සිතුවම් නිර්මාණයකර ඇති බව විහාර සිතුවම් අතර සඳහන් වේ. එසේම පැරණි බුදු සමයේ තිබූ ගබ් පෙලහර පානා උපාසක මහතෙකු වන එල්. සමරවීර (දීගොඩ බාලමහත්තයා) සමඟ ද සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡාව ඇසුරින් ද පැහැදිලි කරගත හැකි විය. මෙම විහාර සිතුවම් අධ්‍යයනට අමතරව මෙම විහාරස්ථානය හා ඒ ආශ්‍රිතව අදටත් පවතින හාස්කම් රැසක් හා ගන්ධබ්භ සංකල්පය ආදී පිළිබඳව ගම්වාසී ජනයා තුළ ඇත්තේ අසීමාන්තික වූ ආධ්‍යාත්මික භක්තියකි.

## නිගමනය

මහනුවර යුගයට අයත් පහතරට සිතුවම් සම්ප්‍රදායේ සිතුවම් සහිත ස්ථානයක් ලෙස හඳුනා ගැනෙන පරගොඩ රජමහා විහාරය ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් වටිනා විහාරස්ථානයකි. එසේම එහි ඇති බිතුසිතුවම් හා මෝස්තර නිර්මාණයන් මගින් පෙනී යන්නේ ඒ සඳහා විවිධ වූ කන්ද උඩරටින් ඇරඹි නුවර යුගයේ සිතුවම් හා පහතරටට ම ආවේණික වූ බලි චිත්‍ර සම්ප්‍රදායේ ආභාෂයත්, කොළඹ යුගයේ කලා ශිල්පීයෙකු වූ එම්. සාර්ලිස් චිත්‍ර ශිල්පියාගේ සිතුවම් ශෛලීන් ආදී වූ කලා ශෛලීන්ගේ එකතුවකි. මෙම සිතුවම් පහතරටට ම ආවේණික බවකින් මනා පෞඪත්වයක් උසුලනු ලබන අතර කාලයාගේ ඇවෑමෙන් බොහෝ සිතුවම් ප්‍රමාණයක් මේ වන විට විනාශ වී ගොස් ය. ඒ සඳහා බලපානු ලබන සාධක අතර අනිසි මිනිස් ක්‍රියාකාරකම් බල පා තිබේ.

විශේෂයෙන් බුදුන් වැඳීමට පැමිණෙන බැතිමතුන් බිම හිඳ ගැනීමේ දී මෙම සිතුවම් සහිත බිත්ති මතට හේත්තු වී සිටිමින් සිය ආගමික වතාවත් ඉටු කරනු අදට ද දැකගත හැකිය. ඇතැම් විට එවැනි නොදැනුවත්භාවය හා නොසැලකිලිමත්භාවය නිසාවෙන් එහි ඇති සිතුවම් බොහෝමයක් අකාලයේ විනාශ වී ගොස් ය. මේ පිළිබඳව අවධානය යොමුකල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එම සිතුවම් සංරක්ෂණයට පියවර ගෙන ඇති ආකාරයක් පෙනේ. කෙසේ නමුත් එම සිතුවම් සංරක්ෂණය කළද නිසි පරිදි නඩත්තු කටයුතු සිදුකිරීම කාලීන අවශ්‍යතාවයකි. ඒ අනුව මෙවැනි වටිනා උරුමයන් ආරක්ෂාකර ගනිමින් ඉදිරියට පවත්වාගෙන යාම සියලු දෙනාගේම මාහැඟි යුතුකමක් වන්නේ ය



ආශ්‍රිත මූලාශ්‍රය

- නුවර යුගයේ විහාර සිතුවම් හැඩකල බලි ඇඳුරු වත ගොත Google[Online].[Available from: https://lankasara.com/si ][ Accessed Date: 20nd June 2023].
- මහබාගේ (30 April 2018), පරගොඩ රජමහා විහාරය Facebook[Online][Available from; https://web.facebook.com/267536100356886/posts/442991076144720/?_rdc=1&_rdr ][ Accessed Date: 20nd June 2023]
- පරගොඩ රජමහා විහාරය (08 September 2016), Facebook[Online][Available from; https://web.facebook.com/ParagodaRajaMahaWiharaya/videos/1778088959113628


සම්මුඛ සාකච්ඡා:-

- අදටත් විහාරස්ථානය හා සම්බන්ධව කටයුතු කරන උපාසක මහතෙකුවන පරගොඩ පදිංචි එල්. සමරවීර (දීගොඩ බාල මහත්තයා) උපාසක මහතා, වයස 78.


**ඇමුණුම්**




ඡායාරූප අංකය 01- ප්‍රතිමා ගෘහය තුළ වැඩ සිටින හිඳි බුද්ධ ප්‍රතිමාව සහ අටවිසි හිඳි බුද්ධ ප්‍රතිමා



ඡායාරූප අංකය 02- මහනුවර යුගයේ කලා ලක්ෂණ පෙන්නුම් කරන බුද්ධ ප්‍රතිමා




ඡායාරූප අංකය 03 - ජ්‍යොතිෂයේ එන රාශි දොලහ දැක්වෙන වියන්තල සිතුවම




ඡායාරූප අංකය 04 - සැරසිලි මෝස්තර අතර එන ඉර හඳ සංකේතවත් කිරීම




ඡායාරූප අංකය 05 - නෙළුම් මල් හා ලියවැල් මෝස්තර යෙදීම



ඡායාරූප අංකය 06 - විශ්ණු දේවාලයට පිවිසෙන දොරටුව ඉහළින් ඇති ලාංඡනය



ඡායාරූප අංකය 07 - සත් සතිය



ඡායාරූප අංකය 08 - සාර්ලිස් ශිල්පීය ලක්‍ෂණවලින් යුතු සිතුවම්